**<u>බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම - 2023 (II) අදියර</u>**

**<u>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය</u>**

බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම - 2023 (II අදියර) ට අදාළව 2023.10.29 දින පවත්වන ලද තරඟ විභාගයේ ප්‍රතිඵල මත, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණ 2023.11.21, 2023.11.22, 2023.11.23, 2023.11.24 සහ 2023.11.25 යන දින වලදී බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත පිහිටි බස්නාහිර පළාත්, පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේදී පැවැත්වීමට නියමිත වේ.

02. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට අදාළ අපේක්ෂකයන් නියමිත දිනයේදී සහභාගී විය යුතුය. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී නිර්දේශ කරනු ලබන අයදුම්කරුවන් එදිනම ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කරන බැවින්, ප්‍රායෝගික පරීක්ෂණයට මුහුණදීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් වී පැමිණීම අනිවාර්යය වේ.

04. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් ලිපිලේඛන වල <u>මුල් පිටපත්</u> හා <u>සහතික කරන ලද ඡායා පිටපත්</u> ගොනු වෙන් වෙන්ව රැගෙන පැමිණිය යුතු වේ.

I. උප්පැන්න සහතිකය
II. වලංගු ජාතික හැඳුනුම්පත/වලංගු රියදුරු බලපත්‍රය/වලංගු ගුවන් ගමන් බලපත්‍රය
III. පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාමනිලධාරී සහතිකය (DS 04)
IV. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ අයතනයකින් ලබා ගත් උපාධි සහතිකය සමඟ විස්තරාත්මක ප්‍රතිඵල ලේඛණය.
V. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේදී එක් වරකදී විෂයයන් තුනක් සමත්වූ බවට අදාළ සහතික
VI. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී මව්බස හා ගණිතය සඳහා සාමාර්ථයන් සහිතව සම්මාන තුනක් සහිතව විෂයයන් 06 කින් සමත් වූ බවට අදාළ, විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ සහතික (අවම වශයෙන් එක් අවස්ථාවකදී විෂයයන් 05 කින් සමත් වී තිබිය යුතුය)
VII. නමෙහි වෙනසක් ඇත්නම් දිවුරුම් ප්‍රකාශය

<u>සැලකිය යුතුයි :</u>

<u>ලේඛණ පසුව ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා නොදෙන බැවින්, ඉහත සඳහන් සියළු ලිපිලේඛණ මුල් පිටපත් හා සහතික කළ පිටපත් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී නිවැරදිව ඉදිරිපත් කළ යුතු බව අවධාරණය කරනු ලැබේ.</u>

## <u>ප්‍රායෝගික පරීක්ෂණය</u>

ප්‍රායෝගික පරීක්ෂණයේදී අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් (PRESENTATION) කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | |

**<u>මෙම ප්‍රායෝගික පරීක්ෂණයේදී ගුරු වෘත්තියේදී වැදගත්වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීමට අදහස් කෙරේ.</u>**

ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය

(i) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි පහ (05)කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.

(ii) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.

(iii) ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා අයදුම්කරුවෙකු එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 02 බැගින් ලබා ගත යුතුය.

(iv) ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

නිර්ණායකයන් හි අරමුණු

**(i) අරමුණ හා ප්‍රවිශ්ට වීම**

සාර්ථකව පාඩමෙ හි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

**(ii) පෞරුෂය හා හඬ පාලනය**

ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමට ඇති හැකියාව ඇගයීම.

**(iii) සන්නිවේදනයේ පැහැදිලි බව**

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

**(iv)** කාල කළමනාකරණය

ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ලඟා වීමේ කුසලතාවය ඇගයීම.

**(v) ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය**

අරමුණ කෙරෙහි ලඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත